සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය 2024

| දේශපාලන විද්‍යාව II | 23 S II | 13 ශ්‍රේණිය |
|---|---|---|
| අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි | | පැය තුනයි |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් * මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.
* පළමුවෙනි කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්ද ,දෙවැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද , තුන්වෙනි කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්ද වනසේ තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

1. "දේශපාලනය" යනු විවිධ අර්ථකථයන්ට භාජනය වූ සංකල්පයකි. සාකච්ඡා කරන්න. (ලකුණු 20)

2. i. ඒකීය ආණ්ඩුක්‍රමය යන්න අර්ථකථනය කරන්න. (ලකුණු 05)
ii. සන්ධීය ආණ්ඩුක්‍රමයන් තුළ දැක්ය හැකි ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 15)

3. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය සමාජවාදී රාජ්‍ය මාදිලියෙන් වෙනස්වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

## II කොටස

4. i. "සෝල්බරි ව්‍යවස්ථාව යටතේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ව්‍යවස්ථාදායක බලය උත්තරීතර නොවීය." පැහැදිලි කරන්න. (ලකුණු 10)
ii. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ සෙනට් සභාවක් පිහිටවීමෙන් අපේක්ෂා කරන ලද අරමුණු කොතෙක් දුරට ඉටුවූයේද? විමසන්න. (ලකුණු 10)

5. 1972 ව්‍යවස්ථාව තුළ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 20)

6. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව පහත දක්වා ඇති මාතෘකාවලින් දෙකක් සාකච්ඡා කරන්න.
i. 13 වන සංශෝධනයෙහි ප්‍රධාන ලක්ෂණ
ii. 17 වන ව්‍යවස්ථා සංශෝධනය සහ ඉහළ අධිකරණවල ස්වාධීනත්වය
iii. ජනමත විචාරණය පිළිබඳ විධිවිධාන (ලකුණු 10x2)

7. 1978 ව්‍යවස්ථාවට අදාළව පහත සදහන් ශීර්ෂයන්ගෙන් එකක් සාකච්ඡා කරන්න.
i. අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ න්‍යාය සහ භාවිතය
ii. සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාවට නැගෙන ආකාරය
iii. 19 වැනි සංශෝධනය ජනාධිපතිවරයාගේ බලතලවලට කරන ලද බලපෑම
iv. 19 වැනි සංශෝධනය පාර්ලිමේන්තුවේ සහ අගමැතිවරයාගේ තත්වයට බලපාන ලද ආකාරය (ලකුණු 20)

2 පිටුව බලන්න

## III කොටස

8. පහත ශීර්ෂයන්ගෙන් එකක් සාකච්ඡා කරන්න
   i. ඇමරිකානු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ.
   ii. ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ සන්ධීය සහ ඒකීය ලක්ෂණ. (ලකුණු 20)

9. i. රාජ්‍ය ප්‍රතිපත්ති ශාස්ත්‍රීය ලෙස හැදෑරීම ආරම්භ වූ සන්දර්භය (පසුබිම) පැහැදිලි කරන්න.
   ii. රාජ්‍ය ප්‍රතිපත්ති වලට අදාළව සිවිල් සමාජයේ භූමිකාව විමසන්න. (ලකුණු 10x2)

10. පහත සඳහන් මාතෘකාවන්ගෙන් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    i. බලතල බෙදීමේ න්‍යාය
    ii. සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණ
    iii. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති සම්පාදකයන් මුහුණ දෙන අභියෝග
    iv. දේශපාලන පක්ෂ වාර්ගීකරණය
    v. ජාතිකවාදය ප්‍රකාශයට පත්වන ප්‍රධාන ස්වරූප (ලකුණු 10x2)

***

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

| දේශපාලන විද්‍යාව I | 23 S I | පැය දෙකයි |
|---|---|---|
| 13 ශ්‍රේණිය | | විභාග අංකය - ................................ |

උපදෙස්:*

- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් හා B කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20කින් යුක්ත වේ.
- එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100කි.

## A කොටස

- ප්‍රශ්න අංක 1-20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. විසිවෙනි සියවසේ දේශපාලන විද්‍යාව යන්නට ලැබෙන අර්ථය වන්නේ,
    (1) රාජ්‍යය පිළිබඳ අධ්‍යයනය කරන විෂය යන්නයි.
    (2) බලය පිළිබඳ අධ්‍යයනය කරන විෂය යන්නයි.
    (3) ස්වභාවික විද්‍යාවේ විධික්‍රමය භාවිතා කරමින් හැදෑරීම යන්නයි.
    (4) ප්‍රතිමානීය ප්‍රවේශය භාවිතා කරමින් අධ්‍යයනය කිරීමයි.
    (5) ගැටුම් සහ සාමය පිළිබඳ අධ්‍යයනය කරන විෂය යන්නයි. (...........)

02. විද්‍යාත්මක ප්‍රවේශයට අදාළ වන්නේ,
    (1) දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියයි.
    (2) මූලික අරමුණ වන්නේ යහපත් පාලන ක්‍රමයකට මග පෙන්වීමයි.
    (3) ඇගයුම්ශීලි විනිශ්චයන්ගෙන් නිදහස් ය.
    (4) දාර්ශනික සම්ප්‍රදාය ගරු කරයි.
    (5) ආනුභවික ක්‍රමවේදය බැහැර කරයි. (...........)

03. රාජ්‍යයට අදාළව නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,
    (1) පූර්ව නූතන රාජ්‍ය අනම්‍ය දේශසීමාවලින් යුක්තය.
    (2) කාලය විසින් වෙනස්කම්වලට යටත් කොට නැත.
    (3) එක් ජාතියක් එක් රාජ්‍යයක් යන්න වර්තමාන රාජ්‍යවල අභ්‍යන්තර සාමයට හේතු වී ඇත.
    (4) ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීමේ ඒකාධිකාරී බලය සතුය.
    (5) අසල්වැසි රාජ්‍යයන්ගේ ආධිපත්‍යයට යටත්ය. (...........)

04. සිවිල් සමාජය යන්නට අදාළ වන්නේ,
    (1) පොදු අර්ථකථනයක් සහිතය.
    (2) ආණ්ඩුවේ උපකරණයකි.
    (3) බලපෑම් කණ්ඩායම් සඳහා යෙදෙන පර්යාය පදයකි.
    (4) ප්‍රජාතන්ත්‍රවාදයට හානිදායකය.
    (5) සක්‍රීය පුරවැසියන්ගේ අවකාශය ලෙස සැලකිය හැකිය. (...........)

05. සන්ධීය ආණ්ඩුක්‍රමයකට අදාළ වන්නේ,
    (1) වාර්ගික එකඟතාවයක් මත ගොඩ නගාගෙන ඇත.
    (2) බහුවිධතාවයන් බහුල සමාජයන්ට යෝග්‍ය නොවේ.
    (3) ව්‍යවස්ථාදායකය ඒක මාණ්ඩලික වේ.
    (4) උපරිමාධිකරණය මධ්‍යම ආණ්ඩුව සතු වේ.
    (5) බලය කේන්ද්‍ර අභිසාරී වේ. (...........)

06. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය,
(1) ව්‍යවස්ථාදායකයට සහ විධායකයට වෙන් වෙන් වූ පැවැත්මක් නැත.
(2) ව්‍යවස්ථාදායකය සහ විධායකය තෝරා ගැනීමට මැතිවරණ දෙකක් පවත්වයි.
(3) ස්ථාවර ආණ්ඩුක්‍රමයක් බවට පොදු පිළිගැනීමක් ඇත.
(4) සාමූහික වගකීම නොවැදගත් කොට සලකයි.
(5) තථ්‍ය විධායකයෙන් පමණක් සමන්විත වේ. (..........)

07. ලිබරල්වාදයේ එක් දාර්ශනික පැතිමානයක් වන්නේ,
(1) නිදහස අතිශයින්ම සීමිත දෙයක් ලෙස සංකල්ප ගත කිරීමයි.
(2) නිදහස රජ කරන සමාජයක පුද්ගල ශක්‍යතා වර්ධනය වන බවයි.
(3) රාජ්‍ය තනි තනි පුද්ගලයාට පූර්වක බවයි.
(4) පුද්ගලයින් අත් අඩංගුවට ගැනීමේ පරම බලයක් රාජ්‍ය සතු බවයි.
(5) බලයේ උල්පත රාජ්‍යය වන බවයි. (..........)

08. නිරාගාමිකවාදය,
(1) ආගමික මතවාදයකි.
(2) රාජ්‍යය සහ පල්ලිය සන්ධානගත කිරීමට යෝජනා කරන ලදී.
(3) රාජ්‍ය ප්‍රතිපත්ති තුළ ආගමික සාරධර්ම පිළිබිඹු විය යුතු බව අවධාරණය කළේය.
(4) රාජ්‍යයට නිල ආගමක් පැවතිය යුතු බවපිළිගත්තේය.
(5) සුළුතර ආගමික කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වැදගත් උපාය මාර්ගයක් විය. (..........)

09. බලතල බෙදීමේ න්‍යාය,
(1) ඇමරිකානු ආණ්ඩුක්‍රමය නිරීක්ෂණය කිරීමෙන් ගොඩනගන ලද්දකි.
(2) රාජ්‍ය යේ බලය පළාත් මට්ටමට බෙදාහැරිය යුතුබව යෝජනා කරයි.
(3) එක් පුද්ගලයෙකු හෝ එක් කණ්ඩායමක් අත ආණ්ඩුවේ ත්‍රිවිධ බලතල ඒකරාශී වීමට විරුද්ධ වේ.
(4) ශුද්ධ ලෙස ක්‍රියාවට නැගීමෙන් ආණ්ඩුවේ කාර්යක්ෂමතාවය වැඩිකළ හැක.
(5) හොඳින් ප්‍රකාශයට පත්වන්නේ පාර්ලිමේන්තු කැබිනට් ආණ්ඩුක්‍රම තුළය. (..........)

10. ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,
(1) ව්‍යවස්ථානුකූලවාදය මත පදනම් වීමයි.
(2) නිදහස් ජනමාධ්‍ය ආණ්ඩුවේ සිව්වන ආයතනය ලෙස සැලකීමයි.
(3) සංවරණ තුලන මත පදනම් වීමයි.
(4) බලතල බෙදී තිබීමයි.
(5) පාලකයාගේ බලය කෙරෙහි නෛතික හෝ බාහිර සංරෝධක නොමැති වීමයි. (..........)

11. සංහිඳියාව ඇති කිරීමේ දකුණු අප්‍රිකානු අත්දැකීමේ සුවිශේෂ ලක්ෂණය වන්නේ,
(1) සුව කිරීමේ යුක්ති ප්‍රවේශය ආදේශ කිරීමයි.
(2) දේශපාලන ක්‍රියාමාර්ගවලට අඩුවැදගත් කමක් ලබා දීමයි.
(3) සමාජීය ක්‍රියාමාර්ග නොසලකා හැරීමයි.
(4) වැරදිකරුවන් සොයා දඬුවම් කිරීමට ගැටුමට සම්බන්ධ දෙපාර්ශවයම නිර්හිත වීමයි.
(5) සහමන්ත්‍රණය යොදා ගැනීමයි. (..........)

12. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයට අදාළ මෑත කාලීන වර්ධනයක් වන්නේ,
(1) පැරණි පක්ෂ නැවත ශක්තිමත් වෙමින් තිබීමයි.
(2) ප්‍රධාන දේශපාලන පක්ෂ සහ ඒවායේ නායකත්වය පිළිබඳ මහජන විශ්වාසය බිඳ වැටීමයි.
(3) දැඩි න්‍යායාත්මක ස්ථාවර මත පදනම්ව කටයුතු කිරීමයි.
(4) උතුරේත් දකුණේත් ජනවාර්ගික පක්ෂවල ආකර්ශණය වැඩි වීමයි.
(5) අධිපති තනි පක්ෂ රටාවක් වර්ධනය වෙමින් තිබීමයි. (..........)

13. ඇමෙරිකානු ආණ්ඩුක්‍රමයට අදාළ වන්නේ,
(1) දීර්ඝ ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් මග පෙන්වීමයි.
(2) අධිකරණ විමර්ශනයන්ගෙන් මධ්‍යම පාර්ලිමේන්තුව නිදහස්ය.
(3) සිරිත් විරිත් සහ සම්ප්‍රදායන් අතිශයින් වැදගත්ය.
(4) වර්තමානයේ ප්‍රාන්තවල බලය වැඩිවෙන දිශාවකට ආණ්ඩුක්‍රමය පරිවර්තනය වෙමින් තිබේ.
(5) සුප්‍රීම් උසාවියේ කාර්යභාරය අතිශයින්ම සීමිත සන්ධිය ක්‍රමයකි. (..........)

14. ඉන්දියානු සන්ධීය ආණ්ඩු ක්‍රමය,
(1) සම්භාව්‍ය සන්ධීය මාදිලියට අයත් වේ.
(2) සමාන බලතල සහිත ප්‍රාන්තවලින් සුසැදි සංගමයකි.
(3) දැඩි අනම්‍ය සන්ධීය ක්‍රමයක් ලෙස සැලකේ.
(4) වර්තමානයේ ආණ්ඩුක්‍රමය තුළ ෆෙඩරල් ලක්ෂණ ශක්තිමත් වෙමින් පවතී.
(5) ව්‍යවස්ථාදායකයේ කොටසක් වන ලෝක් සභාව ප්‍රාන්ත නියෝජනය කරනු ලබයි. (..........)

15. න්‍යායාත්මකව සලකා බලන කළ රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රාරම්භනය කරනු ලබන්නේ,
(1) ව්‍යවස්ථාදායකය විසිනි.
(2) විධායකය විසිනි.
(3) විශේෂඥ දැනුම සහිත නිලධාරීන් විසිනි.
(4) අධිකරණය විසිනි.
(5) දේශපාලන පක්ෂ විසිනි. (..........)

16. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ,
(1) ස්වදේශීය ජනතාවගේ අභිලාස මත පදනම් විය.
(2) ආණ්ඩුකාරවරයාගේ බලය දැඩි ලෙස පාලනය කළ හැකි ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කරන ලදී.
(3) ආණ්ඩුකාරවරයාගේ පාලනයෙන් මිදුන ශ්‍රේෂ්ඨාධිකරණයක් ඇති කරන ලදී.
(4) සීමිත ඡන්ද බලය හඳුන්වා දෙන ලදී.
(5) කුල ක්‍රමය තහනම් කරන ලදී. (..........)

17. සෝල්බරි ආණ්ඩුක්‍රමයට අදාළ වන්නේ,
(1) සමූහාණ්ඩු සංකල්පය මත පදනම් වීම.
(2) සම්පූර්ණයෙන්ම මහජන නියෝජිතයන්ගෙන් සමන්විත ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කිරීම.
(3) සාමූහික වගකීමෙන් අමාත්‍ය මණ්ඩලය නිදහස් කිරීමයි.
(4) ස්වාධීන රාජ්‍ය සේවයක් සහ අධිකරණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගැනීම .
(5) බ්‍රිතාන්‍ය සමඟ පැවති සියළු නෛතික බැඳීම් අවසන් කර දැමීම. (..........)

18. ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලට අදාළ වන්නේ,
(1) ප්‍රථමවතාවට වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදාය ලංකාවට හඳුන්වා දෙන ලදී.
(2) රාජ්‍ය මන්ත්‍රණ සභාවට පූර්ණ ව්‍යවස්ථාදායක බලතල ලබා දෙන ලදී.
(3) රාජ්‍ය සේවය පාලනය පිළිබඳ වගකීම ලාංකිකයක් අතට ලබා දුන්නේය.
(4) සම්පූර්ණ විධායක බලය රාජ්‍ය නිලධාරීන් අත සංකේන්ද්‍රණය වී තිබුණි.
(5) රාජ්‍ය මන්ත්‍රණ සභාව විසුරුවා හැරීමේ බලය ආණ්ඩුකරුට ලබා දුන්නේය. (..........)

19. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව ,
(1) ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් විසින් සකස් කර සම්මත කළේය.
(2) සුළු ජන කණ්ඩායම්වලට ප්‍රමානවත් රැකවරණයක් සහතික කළේය.
(3) සිංහල සහ දෙමළ භාෂා රාජ්‍ය භාෂා බවට පත් කළේය.
(4) රාජ්‍ය සේවය දේශපාලන නායකත්වයේ ග්‍රහණයෙන් මුදවා ගත්තේය.
(5) ව්‍යවස්ථා අධිකරණයට පනත් නිෂ්ප්‍රභා කිරීමේ බලය ලබා දුන්නේය. (..........)

20. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති සම්පාදනයට දීර්ඝ කාලීනව බලපා ඇති සාධකයක් වන්නේ,
(1) ඇමරිකාව සහ චීනය අතර ඇති වෙළඳ යුද්ධය.
(2) විදේශ ප්‍රතිපත්ති ප්‍රභූන්ගේ දේශපාලන මනෝවිද්‍යාත්මක චර්යාව.
(3) බ්‍රිතාන්‍ය යේ යටත් විජිතයක්ව පැවතීම.
(4) ඊශ්‍රායල - පලස්තීන ගැටුම.
(5) මැද පෙරදිග රාජ්‍යයන්ගෙන් ලැබෙන ආර්ථික ආධාර (..........)

- ප්‍රශ්න අංක 21 – 25 දක්වා නිරවද්‍ය ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

21. 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව,
   (A) ජනතා පරමාධිපත්‍ය පූර්තිමත් කරන ලදි.
   (B) ව්‍යවස්ථාදායක බලය උත්තරීතර විය.
   (C) ජාතික රාජ්‍ය සභාවට ජාතික රාජ්‍ය සභාව සමානවම බලතල සහිත වෙනත් ආයතන ඇති කළ හැකිවිය.
   (D) ජාතික රාජ්‍ය සභාවට එහි බලය අත්හළ නොහැක.
   (E) ව්‍යවස්ථාවට අනනුකූල පනත් 2/3 බහුතරයෙන් සම්මත කළ හැකි විය.

   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E

22. සමකාලීන ලෝක දේශපාලනයේ ප්‍රවනතා වන්නේ,
   (A) නව සීතල යුද්ධයක ආරම්භය සනිටුහන් වීමයි .
   (B) ඇමරිකානු ආධිපත්‍ය ලෝකය පුරා ස්ථාවර වීමයි.
   (C) මැද පෙරදිග රාජ්‍යයන් බොහෝමයක් රුසියානු ලැදි ප්‍රතිපත්තියකට මාරු වෙමින් සිටීමයි
   (D) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අධිකාරි බලය අභියෝගයන්ට පාත්‍ර වෙමින් තිබීමයි.
   (E) චීන - තායිවාන අර්බුදය නව උණුසුම් යුධකලාපයක් නිර්මාණය කරමින් තිබීමයි.

   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E

23. 1978 ව්‍යවස්ථාවට එකතු කරන ලද 18 වැනි සංශෝධනය,
   (A) ව්‍යවස්ථාවේ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ වැඩි කළේය.
   (B) පාර්ලිමේන්තු සභාව හඳුන්වා දෙන ලදි.
   (C) ජනාධිපතිවරයාගේ ධුරවාර ගණනට පනවා තිබූ සීමාව ඉවත් කෙරුණි.
   (D) අධිකරණයේ සහ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය අවප්‍රමාණ කළේය.
   (E) පාර්ලිමේන්තු සභාවේ බලය නිරීක්ෂණ ඉදිරිපත් ඉදිරිපත් කිරීමට සීමා වූවායැයි කිව හැකිය.

   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E

24. 1978 ව්‍යවස්ථාවට එකතු කරන ලද 19 වැනි සංශෝධනය ,
   (A) අගමැතිවරයා ශක්තිමත් කළේය.
   (B) පාර්ලිමේන්තුවේ තත්වය ඉහළ දැමුවේය.
   (C) අධිකරණය ස්වාධීන කළේය.
   (D) ජනාධිපතිවරයාගේ නිල කාලය අඩු කළේය.
   (E) දේශපාලනයෙන් ස්වාධීන වූ පුද්ගලයන් බහුතරයක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ඇති කළේය.

   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E

25. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය,
   (A) 1987 දී අත්සන් කරන ලද ඉන්දු ලංකා ගිවිසුමෙහි ප්‍රතිඵලයකි.
   (B) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්ම බලය බෙදා හැරීමට කටයුතු කර ඇත.
   (C) බලය බෙදා ගැනීමේදී ඉන්දියානු ආකෘතිය ආදර්ශයට ගෙන ඇත.
   (D) ජනාධිපතිවරයාට වග කියන ප්‍රධාන අමාත්‍ය තනතුරක් ඇති කර ඇත.
   (E) ව්‍යවස්ථානුකූලව පොලිස් සහ ඉඩම් ලබතල ලබා දී ඇත.

   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E

- අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1) (2) (3) (4) සහ (5) යන වරණ වලින් කවර වරණයදැයි තෝරා එහි අංකය වරහන තුළ ඇති තිත් ඉර මත ලියන්න .

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍යයි | සත්‍යයි |
| (2) | සත්‍යයි | අසත්‍යයි |
| (3) | අසත්‍යයි | සත්‍යයි |
| (4) | අසත්‍යයි | අසත්‍යයි |
| (5) | සත්‍යයි | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි |

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 26. | 1978 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ බලය උත්තරීතර වන්නේය. | පාර්ලිමේන්තුව 2/3 බහුතර බලයෙන් සමස්ත ව්‍යවස්ථාවම පරිච්ඡින්න කිරීමේ බලය හිමිකර ගෙන ඇත. (.........) |
| 27. | 1978 ව්‍යවස්ථාව යටතේ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ ජනාධිපතිවරයාය. | 1978 ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාට අමාත්‍ය මණ්ඩලයේ නායකයා ලෙස කටයුතු කළ හැක්කේ තම පක්ෂයට පාර්ලිමේන්තුවේ බහුතරය හිමිවන විටය. (.........) |
| 28. | 1972 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා ජාතික රාජ්‍ය සභාවට වගකීමට බැඳී නැත. | ජාතික රාජ්‍ය සභාවේ පළමු වාරයේදී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පරාජය වූ විටක අගමැතිවරයා විසින් ජාතික රාජ්‍ය සභාව විසුරුවා හරින ලෙස ජනාධිපතිට උපදෙස් දෙනු ලැබුවද එම උපදෙස් පිළිනොපැද සිටීමේ බලය ජනාධිපතිවරයා සතුවේ. (.........) |
| 29. | 1978 ව්‍යවස්ථාව අගමැතිවරයාගේ තත්වය සාමාන්‍ය ඇමතිවරයෙකුගේ තත්වයට පහත හෙළා ඇත. | අගමැතිවරයාට 1947 සහ 1972 ව්‍යවස්ථාවලදී හිමි වූ ඇමතිවරු මෙහෙය වීමේ , අධීක්ෂණය කිරීමේ සහ ඔවුන්ට අණදීමේ බලය 1978 ව්‍යවස්ථාව මගින් හිමිකර දී නැත. (.........) |
| 30. | 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට එකතු කරන ලද 20 වැනි සංශෝධනය පාර්ලිමේන්තු සභාව යළි ස්ථාපිත කළේය. | 20 වැනි සංශෝධනය මගින් ශ්‍රේෂ්ඨාධිකරණයේ සාමාජික සංඛ්‍යාව සහ අභියාචනාධිකරණයේ සාමාජික සංඛ්‍යාව ඉහළ දමන ලදී. (.........) |

## B කොටස

31. i. දේශපාලනය අධ්‍යයනය සඳහා මුලින්ම යොදාගත් අධ්‍යයන ප්‍රවේශය නම් කරන්න.
(1) ....................................................................................................

ii. ආර්ථික ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම රාජ්‍ය විසින් මෙහෙයවිය යුතු යැයි අවධාරණය කරන දේශපාලන මතවාදය කුමක්ද ?
(2) ....................................................................................................

32. i. නියෝජනය සැපයීම ප්‍රධාන අරමුණ කර බිහිවී ඇති දේශපාලන සංවිධාන වර්ගය කුමක්ද?
(1) ....................................................................................................

ii. ආණ්ඩුවෙන් පිටත සිට එහි ප්‍රතිපත්තිය හැසිරවීමට උත්සහ කරන දේශපාලන සංවිධාන වර්ගය කුමක්ද ?
(1) ....................................................................................................

33. i. සිවිල් සමාජය සාංගමික ප්‍රජාතන්ත්‍රවාදයේ අවකාශය ලෙස හඳුන්වා දුන්නේ කවුරුන්ද?
(1) ....................................................................................................

ii. සිවිල් සමාජය යනු රාජ්‍යය හා පුරවැසියන් අතර පවතින සමාජ සංස්කෘතික අවකාශය ලෙස නිර්වචනය කරනු ලැබුවේ කවුරුන්ද?
(1) ....................................................................................................

34. රාජ්‍ය සමාජයේ පවත්නා දේශපාලන බලයේ කේන්ද්‍රීය ප්‍රකාශනය යන්නට ප්‍රධාන අර්ථ දෙකක් පවතී. ඒ දෙක මොනවාද ?
(1) ....................................................................................................
(2) ....................................................................................................

35. යුරෝපීය ෆැසිස්ට්වාදයේ ප්‍රධාන දේශපාලන නායකයින් දෙදෙනා නම් කරන්න.
(1)........................................................(2)........................................................

36. ස්වාධිපත්‍යය සතු ප්‍රධාන ගුණාංග දෙකක් ලියන්න.
(1) ........................................................(2)........................................................

37. සන්ධිය ආණ්ඩුක්‍රමයේ අයහපත් ලක්ෂණ දෙකක් ලියන්න.
(1) ....................................................................................................
(2) ....................................................................................................

38. i. තෝමස් හොබ්ස් ලිබරල් දේශපාලන දර්ශනයට එකතු කරන ලද මූලික ප්‍රවාද තුනෙන් දෙකක් ලියන්න.
(1) ....................................................................................................
(2) ....................................................................................................

39. වාර්ගික ජාතිකවාද විසින් කරනු ලබන දේශපාලන ඉල්ලීම්වල අන්තර්ගත ඉල්ලීම් දෙකක් ලියන්න.
(1) ....................................................................................................
(2) ....................................................................................................

40. ලිබරල් නිරාගාමිකවාදයේ මූළ ධර්ම දෙකක් ලියන්න.
(1) ....................................................................................................
(2) ....................................................................................................

41. ගැටුම්වල සාධනීය කාර්යයන් දෙකක් ලියන්න.
(1) ....................................................................................................
(2) ....................................................................................................

42. ප්‍රජා සම්බන්ධතා ප්‍රවේශය ගැටුම් සමථනයේ අරමුණු ලෙස දක්වන්නේ මොනවාද ?
(1) ....................................................................................................
(2) ....................................................................................................

43. බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීන් විසින් ශ්‍රී ලංකාවේ වතුවගාවට අවශ්‍ය ශ්‍රම ඉල්ලුම සැපයීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න .
(1) ....................................................................................................
(2) ....................................................................................................

44. සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ වූ වෙස්ට්මින්ස්ටර් නොවන ලක්ෂණ දෙකක් ලියන්න.
(1) ..........................................................................................................
(2) ..........................................................................................................

45. i. නීති පිළිබඳ අධිකරණ විමර්ශනය ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියෙන් ප්‍රථමවරට ඉවත්කරන ලද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව කුමක්ද?
(1) ..........................................................................................................

ii. එම ව්‍යවස්ථාවේ එයට අදාළ වගන්තිය කුමක්ද?
(2) ..........................................................................................................

46. ශ්‍රී ලංකාවේ පළාත් සභා ස්ථාපිත කරන ලද නීතිමය ප්‍රතිපාදන දෙක මොනවාද?
(1) ..........................................................................................................
(2) ..........................................................................................................

47. සීමිත ආණ්ඩුව පිළිබඳ සංකල්පය වර්ධනය වීමේදී එයට පසුකාලීනව එකතු වූ අංග දෙකක් ලියන්න.
(1) ..........................................................................................................
(2) ..........................................................................................................

48. i. ප්‍රංශය තුළ ඩිගෝල්වාදී ආණ්ඩුක්‍රමය ස්ථාපිත කරනු ලබන්නේ කුමන ව්‍යවස්ථාව මගින්ද?
(1) ..........................................................................................................

ii. ප්‍රංශයේ ජනාධිපතිවරයා තෝරා ගැනීමට භාවිතා කරන ඡන්ද ක්‍රමය හඳුන්වන්නේ කෙසේද?
(2) ..........................................................................................................

49. ක්වැඩ් (Quad) සංවිධානයට අයිති සාමාජික රාජ්‍යයන් දෙකක් නම් කරන්න.
(1) ..............................................(2)..............................................

50. i. කොමියුනිස්ට් රාජ්‍යයන්ගෙන් ආරක්ෂා වීම සඳහා ඇමෙරිකාව ප්‍රමුඛ බටහිර ඇලිය ගොඩනගන ලද යුධ සංවිධානය කුමක්ද ?
(1) ..........................................................................................................

ii. එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ නිශේධ බලය හිමි රාජ්‍යයන් දෙකක් නම් කරන්න.
..........................................................................................................

***

අ.පො.ස.(උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024
දේශපාලන විද්‍යාව 13 ශ්‍රේණිය
1 පත්‍රය ( පිළිතුරු )

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 1 | 21. | 3 |
| 2. | 3 | 12. | 2 | 22. | 4 |
| 3. | 4 | 13. | 3 | 23. | 5 |
| 4. | 5 | 14. | 4 | 24. | 1 |
| 5. | 4 | 15. | 1 | 25. | 2 |
| 6. | 1 | 16. | 3 | 26. | 4 |
| 7. | 2 | 17. | 4 | 27. | 2 |
| 8. | 5 | 18. | 5 | 28. | 3 |
| 9. | 3 | 19. | 1 | 29. | 5 |
| 10. | 5 | 20. | 2 | 30. | 1 |

( මුළු ලකුණු 2 X 30 = 60 )

31. ප්‍රතිමානීය ප්‍රවේශය / දාර්ශනික ප්‍රවේශය
සමාජ වාදය / මාක්ස් වාදය

32. 1. දේශපාලන පක්ෂ 2. බලපෑම් කණ්ඩායම් / ලොබි කණ්ඩායම්

33. 1. ඇලෙක්සිස් ද තොක්විල් 2. අන්තෝනියෝ ග්‍රාම්ෂි

34. 1 . ඇරිස්ටෝටලියානු අර්ථය 2. වෙබෙරියානු අර්ථය

35. 1. බෙනිටෝ මුසෝලිනි
2. ඇඩොල්ෆ් හිට්ලර්

36. 1. ඒකීය භාවය
2. බෙදිය නොහැකි බව
3. පැවරිය නොහැකි බව

37. විසිවන සියවසේ සිට බලය මධ්‍යගතකරණ දිසාවට නැඹුරු වීම වැළැක්වීමට සන්ධීය වාදයට නොහැකි
වීම.
රාජ්‍ය තුළ කේන්ද්‍රපසාරී බලපෑම් ශක්තිමත් වීම

38. තනි පුද්ගලයා රාජ්‍යයට පූර්වකය
පුද්ගලයා තාර්කික, ස්වායත්ත පුද්ගලයෙකි
රාජ්‍ය සමාජීය නිර්මාණයකි

39. සමාන අයිතිවාසිකම් සහ සමාන පිළිගැනීම
ප්‍රා දේශීය ස්වයං පාලනය
වෙන්ව යාම ( වෙනම රාජ්‍යයක් ඉල්ලීම)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

40. රාජ්‍ය සහ පල්ලි ආයතනික වශයෙන් වෙන් කිරීම
රාජ්‍ය ආගම සමඟ අනන්‍ය නොවීම්
ආගමික අධ්‍යයනයට සහ ප්‍රචාරණයට රාජ්‍ය සම්බන්ධ නොවීම
ආගමික නිදහස පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගැනීම

41. සමාජය වර්ධනය නොවී එක තැන පල්වීම වැළැක්වීම
සමාජ ප්‍රශ්නවලට අවධානය යොමුකරමින් ඒවා විසඳීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම
පුද්ගල හා සමාජ වෙනස්වීමට දායකවීම
සමාජ කණ්ඩායම්වල අභ්‍යන්තර ඒකාග්‍රතාව ශක්තිමත් කිරීම

42. ගැටුමට සම්බන්ධ පාර්ශව අතර සන්නිවේදනය සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීම
වාර්ගික , සංස්කෘතික , සමාජීය විවිධත්වය පිළිගැනීමට හා ඉවසීමට ප්‍රජාවක් අතර ඇති හැකියාව ප්‍රවර්ධනය කිරීම.

43. රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
ඉන්දියානු ශ්‍රමිකයන් ගෙන්වීම

44. * ව්‍යවස්ථාව ලිඛිත වීම
* ව්‍යවස්ථාව අනම්‍ය වීම
* පාර්ලිමේන්තුවේ බලය සීමා වීම
* අධිකරණයට සීමිත සහ අප්‍රකාශිත ලෙස අධිකරණ විවරණ බලය හිමි වීම

45. 1. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව.
2. 48.2 වගන්තිය

46. 1. 1978 ව්‍යවස්ථාවට එකතු කරන ලද 13 වැනි සංශෝධනය
2. 1987 අංක 42 දරණ පළාත් සභා පනත

47. අභිනියෝජිත බලය
භාරකාරත්වය සහ කොන්දේසි සහගත බව
සීමිත ධූර කාලය
නීතියේ ආධිපත්‍ය
බලතල බෙදීම
සංවරණ හා තුලන

48. 1. 1958 පස්වැනි සමූහාණ්ඩු ව්‍යවස්ථාව
2. ද්විත්ව ඡන්ද ක්‍රමය/ දෙවැනි ඡන්දයක් මත තීරණය වන නියත බහුතර ක්‍රමය

49. 1 ඇමෙරිකාව , ඉන්දියාව, ජපානය, ඕස්ට්‍රේලියාව

50. 1. නේටෝ සංවිධානය/ උතුරු අත්ලාන්තික් ගිවිසුම සංවිධානය
2. ඇමරිකාව , බ්‍රිතාන්‍ය , ප්‍රංශය ,රුසියාව , චීනය

( ලකුණු 2X 20 = 40 )

PAST PAPERS WIKI



(11) WWW.PastPapers.WiKi (11)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!